**ධීවර විශ්‍රාම වැටුප් හා සාමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව එය සිදුකර නොතිබුණි. 2007 වර්ෂයට අදාළ විශ්‍රාම වැටුප් වගකීම් ප්‍රතිපාදනය රු.1,242,006,539 ක් වුවත් 2019 දෙසැම්බර් 31 දිනට එවැනි ආයුගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් වගකීම රු.3,915,569,738ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2007 වර්ෂයේදී ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.<br>මේ වන විට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පුළුල් කිරීමෙන් සාධාරණ දායකත්වයක් විශ්‍රාම වැටුප් දායකයාගෙන් ලබාගැනීමට අදාල සාකච්ඡා ධීවර අමාත්‍යාංශය හා මණ්ඩලය අතර පැවැත්වෙමින් ඇත. ඒ අනුව ඉදිරියේදී මේ පිළිබඳව විධිමත් ආකාරයකින් නව ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීමට හැකිවේයැයි අදහස් කෙරේ. | විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයුගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2011 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ඉල්ලුම් කළ ධීවරයන් 121 දෙනෙකුට හිමි නොගෙවූ විශ්‍රාම වැටුප් එකතුව රු. 3,685,792 ක් ගෙවිවා සේ සලකා ගෙවිය යුතු ගිණුමින් ඉවත් කර තිබුණි. මේ හේතුවෙන් ගෙවිය යුතු ගිණුම මෙම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති එම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.<br>යෝජිත නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සකස් කිරීමේදී මෙම දෝෂයන් මගහරවා ගැනීමට අවශ්‍ය තාක්ෂණික හා අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | නිවැරිදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය |

### 1.5.3 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් වගකීම රු.3,915,569ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 9.04ක වැඩි වීමකි. එසේම සමුච්චිත අරමුදලෙහි සෘණාත්මක තත්ත්වය රු.3,288,940,708ක් දක්වා එනම් ඉකුත් වර්ෂයට වඩා සියයට 11.58ක වැඩි වී තිබීමෙන් එයද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. තවද ඉදිරි වර්ෂයන් තුළදී මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය විය හැකි බැවින් ඒ පිළිබඳ සලකා යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කොට මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට ආයතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ගොවි හා ධීවර ප්‍රජාව සඳහා නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පත් කරන ලද විද්වත් කමිටුව 9% ආයෝජන අනුපාතය යටතේ ගොවි හා ධීවර ප්‍රජාව වෙනුවෙන් විශ්‍රාම වැටුපක් සැකසීම සුදුසු බවට තීරණය කරන ලදි. තවද මෙම යෝජනා ක්‍රමයන් සඳහා ආදායම් ගණනය කිරීමේ ක්‍රමවේදයන් සොයා බැලීමටත් තීරණය විය. වගා බදු අරමුදල හා ගොවිසෙත ලොතරැයි ආදායම් මේ සඳහා යොදා ගත හැකි බව මූලික වශයෙන් නිරීක්ෂණය කරන ලදි.<br><br>නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිළිබඳ සඳහන් කර ඇති බැවින් එම රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිත ය. | රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව අඛණ්ඩව පැවැත්ම රැකෙන අයුරින් නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | | |
| (අ) 16 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට සාමාජික ගාස්තු ගෙවීම පැහැර හරින ලද සාමාජිකයන් 72 දෙනකුගේ සාමාජිකත්වය අවලංගු කිරීමට ප්‍රථමයෙන් ඒ සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් | අඛණ්ඩව වාරික 10 ක් නොගෙවූ දායකයින්ගේ දායකත්වය අහෝසි වන බව යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ ධීවරයින්ට පූර්ව දැනුම් දීමක් කර ඇත.<br>තවද, එසේ දායකත්වය අවලංගු වීම පිළිබඳව දැනුම් දීම ධීවර දෙපාර්තමේන්තුව | ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දැන්වීමක් එම දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් අවලංගු වූ සහතිකයක් නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අයිතිය ද අහිමි වී තිබුණි. සාමාජිකත්වය අවලංගු වූවන් හට ශුද්ධ වාරික හා පොලිය ලෙස සමාලෝචිත වර්ෂයේදී රු1,293,842 ක් ආපසු ගෙවා තිබුණි. | මගින් සිදු කරනු ලබන අතර, දායකත්වය අවලංගු වූ ධීවරයින්ට ධීවර දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මගින් නව දායකයකු ලෙස නැවත ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට හැකියාව ඇත. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සම්බන්ධ නිසි බලධාරියා වන ධීවර දෙපාර්තමේන්තුව වෙත විගණන විමසුමේ දක්වා ඇති කරුණු නැවත සිදුනොවීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඔවුන්ව දැනුවත් කරනු ලැබේ. | |
| (ආ) 20 වගන්තිය | 2019 වර්ෂය වෙනුවෙන් මණ්ඩලයේ උපදේශක කාරක සභාවේ සියලුම සාමාජිකයන් පත්කර තිබුණු නමුදු 2016 නොවැම්බර් 03 දිනෙන් පසුව කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | ධීවර විශ්‍රාම වැටුප් උපදේශක කාරක සභාවේ සාමාජිකයින් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට හා කඩිනමින් උපදේශක කාරක සභාව රැස්වීමට අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිතය. | සාමාජිකයන් පත්කර නිසි පරිදි රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,207,069 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.2,247,550 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,454,619 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ අයෝජන වෙනුවෙන් ලද පොළී ප්‍රතිශතය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයට මුළු දායකය රු.340,189 ක් වුවද මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් රු.63,346,699ක්ද ශුද්ධ වාරික ගෙවීම් රු.1,293,842 ක් හා මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් රු.368,000ක් වූයෙන් ලැබුණු දායකය ඉක්මවා අරමුදලින් රු.64,668,352 ක් යෝජනා ක්‍රමයෙන් ගෙවීම් කර තිබුණි. | දැනට පවතින ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයකින් යුතු යෝජනා ක්‍රමයක් නොවන බැවින් නව බඳවාගැනීම් ප්‍රවර්ධනය කිරීම සිදු නොකරයි. නමුත් යෝජනා ක්‍රමයට දායකවී ඇති ධීවරයින් වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා විශ්‍රාම වැටුප් ලැබීම සඳහා සුදුසුකම් ලබන බැවින් මෙලෙස විශ්‍රාම වැටුප් ගෙවීම් වර්ධනය වී ඉවතට ඇදී යන අරමුදල් ප්‍රමාණය වැඩිවී ඇත. | මූල්‍ය ශක්‍යතාවයකින් යුතු නව යෝජනා ක්‍රමයක් සකස් කර නව බඳවාගැනීම් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වුවද යෝජනා ක්‍රමය විසින් එය සකස්කළ දින සිට ගෙවීම් කිරීම නිසා ධීවරයන් 129 දෙනෙකුට හිමි රු.3,940,215 ක විශ්‍රාම වැටුප් ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපචිත කර තිබුණි. | දිගුකාලයක් ධීවර විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම පමාවී ඇති ධීවරයින් හට හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමේදී එසේ ප්‍රමාද වීමට හේතු වූ කාරණා සොයා බැලීමෙන් පසු ගෙවීම් කිරීමේදී පැරණි හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවීම නිසා මෙම තත්වය උදාවී ඇත. යුද්ධය පැවති දිස්ත්‍රික්කයන්ගේ ධීවර විශ්‍රාම වැටුප් අයදුම් කිරීමේදී විශාල ප්‍රමාදයන් දක්නට ලැබුණු බැවින් එසේ ප්‍රමාද වීමට හේතු කාරණා ග්‍රාම නිළධාරී හා ප්‍රාදේශීය ලේකම් ඇතුළු දිස්ත්‍රික් රාජ්‍ය නිළධාරීන්ගෙන් ඒ පිළිබඳව තහවුරු ලබාගැනීමෙන් පසු අදාල මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | හිඟයක් ඇති නොවන පරිදි අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දායකයින් 100ක් බඳවා ගැනීම තුලින් රු.307,000ක දායක මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු සාමාජිකයෙකු යෝජනා ක්‍රමයට බඳවා ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී මරණ, බෙලහීනතාවය සහ නිසි පරිදි වාරික නොගෙවීම මත දායකයින් 96 දෙනෙකු යෝජනා ක්‍රමයෙන් ඉවත්කර තිබුණි. | මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන්නේ ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වන අතර සාමාජිකයින් බඳවාගැනීම ඇතුලුව කාර්යසාධනය ක්‍රියාත්මක වනුයේ ධීවර දෙපාර්තමේන්තුව මගිනි. ඉදිරියේදී ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව මෙම යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයකින් යුතු නව යෝජනා ක්‍රමයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට අපේක්ෂා කරන අතර, ඒ අනුව වඩා ඵලදායී ක්‍රියාත්මක සැළැස්මක් අනුව යෝජනා ක්‍රමය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.<br>නිසිපරිදි වාරික නොගෙවන ධීවරයින් යෝජනා ක්‍රමයෙන් ඉවත්කරන බව දායකයින් බඳවා ගන්නා අවස්ථාවේදී දැනුවත් කර ඇත. තවද, මරණයක් හෝ බෙලහීනතාවයක් ඇති වුවහොත් මරණ පාරිතෝෂික හෝ බෙලහීන ප්‍රතිලාභ ලබාදීම යෝජනා ක්‍රමයේ අන්තර්ගතව ඇත. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුණ පරිදි සාමාජිකයන් අඛණ්ඩව බඳවාගැනීමට කටයුතු කළ යුතුය. |